13362

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2022 (2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022 (2023)

ශ්‍රී ලංකා ඉතිහාසය	I (II කොටස)	25 S I
இலங்கை வரலாறு	I (பகுதி II)	
History of Sri Lanka	I (Part II)	

ශ්‍රී ලංකා ඉතිහාසය - අති අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා

උපදෙස්:
* පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
* **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
* **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **B** හා **C** කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක් I කොටස** සමග සපයා ඇත.)

A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

(i) ජම්බුකෝලපට්ටන (ii) [illegible] (iii) යාපහුව (iv) පරාක්‍රම සමුද්‍රය
(v) ගෝකණ්ණ (vi) මඩකලපුව (vii) මහනුවර (viii) ගාල්ල
(ix) මහවැලි ගඟ (x) නැගෙනහිර පළාත (xi) [illegible] (xii) කල්පිටිය

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

B කොටස

2. අනුරාධපුර යුගයේ ඉතිහාසය හැදෑරීම සඳහා අභිලේඛන මූලාශ්‍ර උපකාරී වන ආකාරය පහත දැක්වෙන ශීර්ෂ යටතේ පරීක්ෂා කරන්න.

(i) වංශකතාවල එන කරුණු තහවුරු කර ගැනීම
(ii) වංශකතාවල එන සාවද්‍ය තොරතුරු නිවැරදි කර ගැනීම
(iii) වංශකතාවල සඳහන් නොවන අලුත් තොරතුරු අනාවරණය කර ගැනීම (ලකුණු 16 යි)

3. "දේවානම්පිය තිස්ස රාජ්‍ය සමය දේශපාලන සහ ආගමික ක්ෂේත්‍රයන්හි වැදගත් අවධියක් සනිටුහන් කරයි."

(i) දේවානම්පිය තිස්ස රජුගේ පියාගේ නම කුමක් ද? (ලකුණු 01 යි)
(ii) දේවානම්පිය තිස්ස රජුගේ රාජධානියෙහි අගනුවර නම් කරන්න. (ලකුණු 01 යි)
(iii) දේවානම්පිය තිස්ස රජුගේ කාලයට පෙර පැවති ආගමික විශ්වාස පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 03 යි)
(iv) දේවානම්පිය තිස්ස රාජ්‍ය සමයෙහි දී දේශපාලන සහ ආගමික අංශවල ඇති වූ වර්ධනයෙහි වැදගත්කම පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 11 යි)

4. පොළොන්නරු යුගයේ ආර්ථික තත්ත්වය පිළිබඳව පහත දැක්වෙන තේමා යටතේ විචාරාත්මක විග්‍රහයක් කරන්න.

(i) වාරි කර්මාන්තය මත පදනම් වූ කෘෂි කර්මාන්තය
(ii) අභ්‍යන්තර සහ බාහිර වෙළෙඳාම (ලකුණු 16 යි)

අටවැනි පිටුව බලන්න.

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) සීගිරිය

(ii) මහසෙන් රජුගේ කාර්ය සාධනය

(iii) යාපනය රාජධානිය

(iv) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍යය

(ලකුණු 08 × 2 = 16 යි)

C කොටස

6. (i) උඩරට රාජධානිය යටත් කර ගැනීම සඳහා පෘතුගීසීන් විසින් දරන ලද ප්‍රයත්න පැහැදිලි කරන්න.

(ii) එම ප්‍රයත්න අසාර්ථක වීමට තුඩුදුන් සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

7. "කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම, පරිපාලන සහ ආර්ථික යන අංශවල දිගු කාලීන වෙනස්කම් රැසක් ඇති කළේ ය."

(i) කෝල්බෲක් ශ්‍රී ලංකාවට පැමිණෙන විට මෙහි සිටි බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) එකල පැවති අධිකරණ ක්‍රමය පිළිබඳව කරුණු සොයා බැලූ කොමසාරිස්වරයා නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) කෝල්බෲක්-කැමරන් කොමිසම පත් කිරීම සඳහා තුඩුදුන් හේතු සැකෙවින් ගෙන හැර දක්වන්න. (ලකුණු 04 යි)

(iv) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආණ්ඩුක්‍රම, පරිපාලන සහ ආර්ථික යන අංශවල සිදු වී ඇති වෙනස්කම් විචාරාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

8. දහනවවන සියවසේ දෙවන භාගයේදී ඇති වූ ආගමික පුනර්ජීවන ව්‍යාපාරය පිළිබඳව පහත දැක්වෙන තේමා යටතේ සාකච්ඡා කරන්න.

(i) මෙම ව්‍යාපාරය පැන නැගීමට තුඩුදුන් පසුබිම (ලකුණු 08 යි)

(ii) ආගමික පුනර්ජීවන ව්‍යාපාරයෙහි ප්‍රධාන ක්‍රියාකාරකම් (ලකුණු 08 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ලන්දේසි ආර්ථික ප්‍රතිපත්තිය

(ii) 1818 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය

(iii) සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක

(iv) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලිකාංග

(ලකුණු 08 × 2 = 16 යි)

* * *